මගේ අංකය:- DGHS/coronavirus outbreak/347/2020 (2)
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය
සෞඛ්‍ය අමාත්‍යාංශය
''සුවසිරිපාය''
කොළඹ 10
2020.03.29.

සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානින් වෙත,

**<u>ඇදිරිනීති කාලය තුල දී රජයේ රෝහල් වලින් සායනික රෝගීන් සඳහා ඖෂධ සැපයීම.</u>**

COVID 19 රෝගය පැතිර යාම හේතුවෙන් දිවයින පුරා ඇදිරිනීතිය ක්‍රියාත්මක වෙමින් පවතින බැවින්, ඔබගේ රෝහලේ සායන පැවැත්වීමට අපහසුතා පැන නැඟී ඇත. එබැවින් එම කාලය තුල ඔබගේ රෝහලේ මාසික සායනයෙන්, ප්‍රතිකාර ලබන රෝගීන්ට ඖෂධ ලබා දීම සඳහා වැඩ සටහනක් සෞඛ්‍ය අමාත්‍යාංශය හා තැපැල් දෙපාර්තුමේනතුව ඒකාබද්ධව ක්‍රියාත්මක කිරිමට රජය විසින් තීරණය කර ඇත.

එබැවින් රෝහල සමීපයේ ඇති තැපැල් කාර්යාලයේ ප්‍රධානියා සමඟ සාකච්ඡා කර එම වැඩ පිළිවෙල සාර්ථක කර ගැනිම සඳහා පහත පියවරයන් අනුගමනය කරන ලෙස සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් වෙත දන්වා සිටිමි.

1. මසකට ප්‍රමාණවත් ඖෂධ නොමැති, ඔබ රෝහල් සායනයේ ලියාපදිංචි, මාසිකව බෙහෙත් ගන්නා, දූරකථනය මඟින් තහවුරු කර ගන්නා ලද සායනික රෝගීන්ගේ නිවස වෙත බෙහෙත් ලබා දීමට රෝහල සමීපයේ ඇති තැපැල් කාර්යාලයේ ප්‍රධාන නිලධාරි සමග කටයුතු කරන්න.
2. සායන පොත වෛද්‍යවරයා විසින් පරීක්ෂා කර, ඖෂධ වට්ටෝරුව නියම කර, අදාල කාර්ය මණ්ඩලය විසින් අදාළ බෙහෙත් පැකැට්ටු සකස් කරන්න. රෝගියාට අදාල නිවැරදි ඖෂධ නියමිත මාත්‍රාවෙන් ලබා දීම සඳහා දෙවරක් පරීක්ෂා කර බලන්න.
3. බෙහෙත් පැකැට්ටුවේ පිටත සායන අංකය, රෝගියාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය සමඟ ආයතනයේ නම පැහැදිලිව සඳහන් කරන්ත. රෝගියාට යම් විමසීමක් කල යුතු නම් එය ඉටු කර ගැනීම පිණිස ඔබගේ ඖෂධ සංයොජක / ඖෂධවේදී ගේ දූරකථන අංකය ද පැකට්ටුවේ සඳහන් කරන්න.
4. බාරදිය නොහැකි නම් නැවත රෝහලට එවන ලෙසද තැපැල් කාර්යාලයේ ප්‍රධාන නිලධාරියාට දන්වන්න.
5. ඖෂධ පැකැට්ටුවේ ඇති පරිදි නම සහ සායන අංකය සඳහන් නාම ලේඛණ දෙකක් සකස් කර එම පැකට්ටු සමඟ, තැපැල් කාර්යාලය වෙත යවන්න. තැපැල් කාර්යාලය භාර ගත් බවට අත්සන තැබීමෙන් පසු එක් පිටපතක් ඔබ කාර්යාලයේද අනෙක් පිටපත තැපැල් කාර්යාලයටද ලබා දෙන්න.

6. ඇතැම් ඖෂධ හිරු එළියට හා තාපයට සංවේදී වන බැවින් ඖෂධ ප්‍රමිතිය ආරක්ෂා වන පරිදි අසුරණ සකස් කර ගැනීමට පියවර ගන්න.

7. අවශ්‍ය පරිදි මුඛ ආවරණ, අත් ආවරණ සහ අත් පිරිසිදු කිරීමේ දියර තැපැල් කාර්ය මණ්ඩලය වෙත ලබාදීමට කටයුතු කරන්න.

8. මෙම ඇඳිරිනීති සමය තුල ඖෂධගාරයෙන් නිකුත් කරන ඖෂධ සඳහා තොග වශයෙන් ගනන් තැබීමේ ක්‍රමය අනුගමනය කිරිමට උපදෙස් දෙන්න.

9. අධික සායනික රෝගින් ප්‍රමාණයක් සිටින රෝහල් සඳහා ඖෂධ පැකට් සකසන කාර්යය මණ්ඩල පැය 24 පුරා සේවයේ යොදවා ගැනීමට අවශ්‍ය වන්නේ නම්,සේවා අවශ්‍යතාවය අනුව කාර්යය මණ්ඩල සේවයේ යොදවා ගැනීමේ බලය ආයතන ප්‍රධානියා වෙත පැවරෙනු ඇත.

10. ඖෂධ සුරක්ෂිතව ඇසුරුම් කිරිම සඳහා ප්‍රමාණවත් සුදුසු ඇසුරුම් ලබා දිමට කටයුතු කරන්න.

11. යම් රෝගියෙකු බෙහෙත් ලබා ගන්නේ වෙනත් දුර බැහැර පිහිටි රෝහලකින් නම්, ලගම ඇති රෝහලට රෝගියා ලග ඇති සායනික පොත යවා ආයතනික ප්‍රධානියා වෙත යොමු කරන්න. එවිට එම ආයතන ප්‍රධානියා විසින් රෝගියා බෙහෙත් ගන්නා ස්ථිර අදාල රෝහල වෙත දුරකථන ඇමතුමක් ලබා දී විමසා බලා තහවුරු කරගෙන ඖෂධ ලබා දීමට කටයුතු කරන්න.

12. ප්‍රදේශයේ පවුල් සෞඛ්‍ය නිළධාරීන්, මහජන සෞඛ්‍ය පරික්ෂක සහ ග්‍රාම නිළධාරීන් වෙත ඔබගේ රෝහලේ දුරකථන අංකය ලබා දී, සායනික රෝගින් වෙත එම අංකය දැනුම් දෙන ලෙස දන්වා සිටිම මඟින්, ඖෂධ ලබා ගැනීමට අවශ්‍ය වන රෝගින්ගේ නිවරදි තොරතුරු ඔබ රෝහලට ලබා ගත හැකි වනු ඇත.

13. සියළුම පලාත් සෞඛ්‍ය හා ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන් සහ රෝහල් ප්‍රධානීන් මෙම ක්‍රියාවලිය නිරන්තර අධීක්ෂණය කර ඵලදායි ලෙස ක්‍රමවත් වැඩසටහනක් ක්‍රියාත්මක කිරිමට වග බලා ගත යුතුය.

මෙම අවධානම් අවස්ථාවේ දී, රෝගි ජනතාව, රෝහල තුල එක් රැස් වීම අවම කර ගනිමින් රෝගින්ට සිදුවන අපහසුතා වැලැක්වීම සඳහා රජය විසින් යොජනා කරන ලද මෙම ඒකාබද්ධ වැඩසටහන සාර්ථක කර ගැනිම සඳහා ඔබ සියලු දෙනා දක්වන සහයෝගය ඉතා අගය කොට සලකමි.

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

විශේෂඥ වෛද්‍ය අනිල් ජාසිංහ
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත් :- 01. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය.
02. සියලුම පලාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්
03. සියලුම ප්‍රාදේශිය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂකවරුන්